**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 09/93**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993 මැයි මස 12 වෙනි දින,

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත.

**රජයේ සේවකයින් සහ විශ්‍රාමිකයින් වෙත අතිරේක**
**<u>දීමනාවක් ගෙවීම</u>**

1989.12.27 දිනැති අංක. 63/89, 1990.11.29 දිනැති අංක. 50/90, 1991.12.25 දිනැති අංක. 50/90(1), 1992..03.26 දිනැති අංක. 50/90(11), 1992..09.25 දිනැති අංක 50/90(111) සහ 1992..01.09 දිනැති අංක. 01/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1993.06.01 දින සිට අවලංගු කෙරේ.

02. 1993 ජූනි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියළු රජයේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට රු. 600/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. විශ්‍රාමිකයන්ට මෙම දීමනාව ගෙවීම, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් සාමාන්‍ය ගෙවීම් කාර්යාල මගින් සිදු කෙරෙනු ඇත.

03. සියළුම තාවකාලික, අනියම්, දෛනික වැටුප් ලබන සහ ආදේශක රජයේ සේවකයන්ට මෙම මාසික දීමනාව දිනකට දීමනාවෙන් 1/21 ක් බැගින් ගණන් බලා, වැඩකරන ලද දින ගණනෙන් වැඩි කර, දින 21 ක උපරිමයකට යටත්ව ගෙවිය යුතුය.

04. 1993.06.01 සිට ක්‍රියාත්මක වන පරිදි, 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ජේදය මේ අනුව සංශෝධනය වනු ඇත.

05. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, ජීවන වියදම් දීමනාව ගෙවීමේ විෂයයෙන් ලබාගත නොහැකි විට, වෙනත් පුනරාවර්තන වැය විෂයයන්ගේ ඉතිරිවීම් ද වීරමොන් ක්‍රියාපරිපාටිය අනුගමනය කරමින් ලබා ගත යුතුය. මේ ආකාරයෙන් මුදල් ලබාගත නොහැකි විට පමණක් අවශ්‍ය අතිරේක මුදල් ගණනය කර ඇති ආකාරය පෙන්නුම් කරමින් එම අතිරේක මුදල් සඳහා අයදුම්පතක් මහා භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

06. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.

අ.කලේ/ එම්.එන්. ජුනයිඩ්.
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය